# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2352/08 - 2023 ඔක්තෝබර් මස 03 වැනි අඟහරුවාදා - 2023.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සළකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 15 වැනි දින.
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
'' සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,

1A - PG 6489— 21 (2023/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

### *කැකිරාව නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම*

*I වන තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.02.10 වැනි දිනැති සහ අංක 1588/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව, නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව නාගරික සංවර්ධන බල ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 620 දුම්රිය නගරය, අංක 631 මල්දෙනිපුර, අංක 629 කුඩා කැකිරාව, අංක 628 කැකිරාව නගරය, අංක 626 මලව, අංක 625 නීකිණියාව (කොටසක්) අංක 624 මයිලගස්වැව (කොටසක්), අංක 637 මහ කැකිරාව, අංක 639 කොරසගල්ල (කොටසක්) යන ග්‍රාම නිලධාරී කොට්ඨාස වලට අමතරව අංක 614 තෝරුවැව, අංක 613 මාමිණියාව, අංක 622 ශාස්ත්‍රවෙල්ලිය, අංක 615 කැලෑ පුලියන්කුලම, අංක 627 මරදන්කඩවල පාර, අංක 616 ඉහළ පුලියන්කුලම, අංක 630 මාන්කඩවල, අංක 632 ඇඹුල්ගස්වැව, අංක 634 පොතානේගම, අංක 635 කුඹුක්වැව, අංක 611 මාමිණියා රඹෑව, අංක 610 ගනේවල්පොල, අංක 619 මුඩපෙරුමාගම, අංක 621 ඉහළගම, අංක 618 ඔළුකරද, අංක 612 කොල්ලන්කුට්ටිගම, අංක 623 කරුක්කන්කුලම, අංක 638 ඔලොම්බෑව, අංක 617 මරදන්කඩවල යන ග්‍රාම නිලධාරී කොට්ඨාස වලට අයත් වන්නා වූ සහ 2009.02.10 වැනි දිනැති සහ අංක 1588/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ අංක 625 නිකිණියාව, අංක 624 මයිලගස්වැව, අංක 639 කොරසගල්ල යන ග්‍රාම නිලධාරී වසම් වල ඉතිරි කොටස් වලට අයත් වන්නා වූ මෙහි II වන තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

*II වන තීරුව*

*උතුරට :*

අංක 616 ඉහළ පුලියන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම A 9 නුවර - යාපනය මාර්ගය ඡේදනය වන ආරම්භක ලක්ෂ්‍යයේ සිට අංක 616 ඉහළ පුලියන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ඊසාන දිශානුගතව ගමන්කර 615 කැලෑ පුලියන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ඊසාන දිශානුගතව අංක 615 කැලෑ පුලියන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ, දකුණු දිශානුගතව ගමන් කර අංක 613 මාමිණියාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ගිණිකොන දිශානුගතව අංක 611 මාමිණියා රඹෑව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම දක්වා ද, එතැන් සිට අංක 611 මාමිණියා රඹෑව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව ගමන් කර එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම දක්වා ද,

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 611 මාමිනියා රඹෑව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව ගමන් කර අංක 610 ගනේවල්පොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක් ද, එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව මරදන්කඩවල - හබරණ මාර්ගය ඡේදනය කරමින් 632 ඇඹුල්ගස්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, උතුරු මායිම ඔස්සේ ගිණිකොන හා නැගෙනහිර දිශානුගතව ගමන්කර එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට දකුණු මායිම ඔස්සේ වයඹ සහ නිරිත දිශානුගතව ගමන් කර අංක 630 මාන්කඩවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව ගමන්කර අංක 634 පොතානේගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු සහ නැගෙනහිර මායිම් ඔස්සේ ගිණිකොන හා දකුණු දිශානුගතව ගමන්කර අංක 635 කුඹුක්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම ඔස්සේ ගමන්කර එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණ දිශානුගතව ගමන්කර එම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණ මායිම හමුවන තෙක් ද,

*දකුණට :*

අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 635 කුඹුක්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණ මායිම ඔස්සේ නිරිත සහ දකුණු

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

***කැකිරාව නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම***

*I වන තීරුව*

*II වන තීරුව*

දිශානුගතව ගමන් කර අංක 639 කොරසගල්ල - ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට කොරසගල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ වයඹ දිශානුගතව දඹුල්ල - මරදන්කඩවල මාර්ගය ඡේදනය කරමින් ගමන්කර අංක 638 ඔලොම්බෑව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නිරිත හා වයඹ දිශානුගතව ගමන්කර අංක 624 මයිලගස්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බස්නාහිර මායිම ඔස්සේ වයඹ දිශානුගතව අංක 623 කරුක්කන්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණ දිශානුගතව ගමන් කර එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණ මායිම හමුවන තෙක් ද,

*බස්නාහිරට* :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 623 කරුක්කන්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණ හා බස්නාහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ගමන්කර නැවත ගිණිකොන දිශානුගතව හා නැවත එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බස්නාහිර මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 619 මුඩපෙරුමාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බස්නාහිර මායිම ආරම්භ වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව ගමන්කර අංක 621 ඉහළගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව ගමන්කර අංක 622 ශාස්ත්‍රවෙල්ලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව ගමන්කර අංක 618 ඔළුකරද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව ගමන් කර දඹුල්ල - මරදන්කඩවල මාර්ගය ඡේදනය කර අංක 618 ඔළුකරද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බස්නාහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බස්නාහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ගමන් කර අංක 612 කෝලන්කුට්ටිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බස්නාහිර මායිම ඔස්සේ වයඹ හා උතුරු දිශානුගතව ගමන් කර අංක 617 මරදන්කඩවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මරදන්කඩවල - දඹුල්ල මාර්ගය ඡේදනය කරමින් බස්නාහිර මායිම ඔස්සේ උතුරු, වයඹ දිශානුගතව හා නැවතත් උතුරු දිශානුගතව ඇඳි රේඛාව ආරම්භක ලක්ෂ්‍යය දක්වා වූ මුළු මහත් භූමි ප්‍රදේශය වේ.

EOG 10 - 0009

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.